# ලංසු ආරාධනයයි !

## වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව

## ගලහෙන්කන්ද ගුරුසිංහගොඩ මාර්ගය කොටසක් කාපට් යොදා සංවර්ධනය කිරීම

වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව විසින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීම සඳහා ජාතික තරඟකාරී ක්‍රමයට මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම - **2026.07.03** දින සිට **2026.07.16** දක්වා පෙ.ව **9.00** සිට ප.ව **3.00** දක්වා
ටෙන්ඩර් භාර ගැනීම - **2026.07.17** ප.ව **1.30** දක්වා
ටෙන්ඩර් විවෘත කිරීම - **2026.07.17** ප.ව **2.00** ට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේදී

| විස්තරය | අවශ්‍ය ලියාපදිංචිය (CIDA) | ලංසු සුරක්ෂණය රු. | ලංසුපත්‍ර ගාස්තුව රු. |
|---|---|---|---|
| 01. ගලහෙන්කන්ද ගුරුසිංහගොඩ මාර්ගය කොටසක් කාපට් යොදා සංවර්ධනය කිරීම | C6, C7හෝ C8 (මාර්ග) | රු. 80,000.00 | රු. 2000.00 |
| ලංසු ඉදිරිපත් කිරීමට පෙර ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලෙසට ලංසුකරුවන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ. | | | |

1. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) මාර්ග ඉදිකිරීම් සඳහා ඉහත ලියාපදිංචිය ඇති කොන්ත්‍රාත්කරුවන්ට මෙම කොන්ත්‍රාත්තුව පවරනු ඇත.

2. ලංසු ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය සභාව වෙත මුදල් ගෙවා ලබා ගන්නා ආකෘතිවලින් පමණක් සිදු කළ යුතු අතර ලංසුපත් පරීක්ෂාව කාර්යාල වේලාව තුල නොමිලයේ සිදුකල හැකිය. වැඩිදුර තොරතුරු සඳහා කාර්යාල වේලාව තුල 091-2260554 දුරකථන අංකය ඇමතීමෙන් ලබාගත හැක.

3. ලංසුව සමඟ ඉදිරිපත් කරනු ලබන ලංසු සුරක්ෂණය වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ සරප් වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබාදෙන කුවිතාන්සිය ලංසුපතේ මුල් පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය. චෙක්පත් හෝ බැංකු අණකර ලෙස ඉදිරිපත් කරන ලංසු ඇපකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ඉදිරිපත් කරනු ලබන ලංසුපත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර එහි මුල් පිටපතෙහි " මුල් පිටපත" යනුවෙන් සඳහන් කළ යුතු අතර අනු පිටපතෙහි "අනු පිටපත " යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසුපත්වල මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරයද මුද්‍රා තබා එහි වම්පස ඉහළ කෙළවරෙහි **"2026.07.17 ප්‍රසම්පාදන කමිටුව සඳහා ගලහෙන්කන්ද ගුරුසිංහගොඩ මාර්ගය කොටසක් කාපට් යොදා සංවර්ධනය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම"** ලෙස සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

5. සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා 2026.07.17 වන දින ප.ව 1.30 ට ප්‍රථමයෙන් ලැබෙන සේ **" සභාපති, ප්‍රසම්පාදන කමිටුව, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව, අගලිය, බද්දේගම"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු පත් හා අඩුපාඩු සහිත ලංසුපත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ලංසුපත් විවෘත කිරීම 2026.07.17 වන දින ප.ව 2.00 ට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ ප්‍රධානත්වයෙන් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේදී සිදු කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයින් හට සහභාගී විය හැක.

7. ලංසුවල වලංගු කාලය දින 77 කි.

8. පූර්ව ලංසු රැස්වීම 2026.07.10 දින පෙ.ව 10.00 ට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේදී පැවැත්වේ.

9. මෙම ලංසු කැඳවීම සම්බන්ධව වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

ජී. එම්. වසන්ත
සභාපති
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව
අගලිය - බද්දේගම

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව,
අගලිය, බද්දේගම.
2026.07.03
E-mail : wdps2006@gmail.com